සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ප්‍රාථමික අංශය
සැකසුම ~ W.D.G.M. ටිකිරි සිරි කුමාරි
ගුරු උපදේශක
දෙහිඕවිට අධ්‍යාපන කලාපය

දයාබර දූ දරුවනි, දෙමාපියනි.

මෙම ව්‍යසනකාරී අවස්ථාවේදී ඔබේත් රටේත් ආරක්ෂාව සඳහා නිවෙස් තුළම රැඳී සිටින දූ දරුවන්ට තම අධ්‍යාපන කටයුතු සඳහා යොමුවීමට අත්වැලක් ලෙස මෙම ක්‍රියාකාරකම් ඉදිරිපත් කරමි. ඔබ සැමට සුවදායක දිවියකට ආසිරි පතමි.

## *ඔවුහු* භාවිතය උගනිමු



1) පහත සඳහන් දී ඇති කොටස කියවමු. එහි *ඔවුහු* සමග යෙදී

**ඇති අතීත කාල වාක්‍ය උපුටා ලියමු.**

- මිහිරි සහ නිපුන නිවාඩු දිනවල ගෙවත්තේ බෝග වගා කරති. ඔවුහු විවිධාකාර බදුන් වල එම බෝග වගා කළහ. ඔවුහු ගෙවත්ත අලංකාර කිරීමට වෙහෙසෙති. දිනක් ඔවුහු අලංකාර වැටක් සකස් කළහ.

**2)ඔබ ලියූ *ඔවුහු* සමග යෙදී ඇති අතීත කාල වාක්‍ය වල ක්‍රියාපද යටින් ඉරක් අඳිමු.**

**3)පහත දී ඇති වාක්‍ය,වර්තමාන කාල හා අතීත කාල වාක්‍ය ලෙස වෙන් කර ලියමු.**

- ඔවූහු ක්‍රීඩා කළහ.
- ඔවුහු පොත් කියවති.
- ඔවුහු පාසල් ගියහ.
- ඔවුහු වාදනය කරති.
- ඔවුහු ශාලාව තුළට ගියහ.
- ඔවුහු කවි ලියති.
- ඔවුහු සාකච්ඡා කළහ.

**4) පහත දී ඇති වාක්‍ය අතීත කාලයෙන් ලියමු.**

1. ඔවුහු විනෝද චාරිකාවක් යති.
2. ඔවුහු විවේක කාලයෙන් ප්‍රයෝජන ගනිති.
3. ඔවුහු උස් කඳු මුදුනක ජීවත් වෙති.
4. ඔවුහු අසරණයන් ට පිහිට වෙති.
5. ඔවුහු දැත් පිරිසිදුව තබා ගනිති.